*සැ. යු.* - 2022.01.20 වැනි දින පළ වූ අංක 2316 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,317- 2023 ජනවාරි මස 27 වැනි සිකුරාදා - 2023.01.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 24 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 29 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 පෙබරවාරි මස 17 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 පෙබරවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් රාජපක්ෂ වාසල රණවාරණ මුදියන්සේලාගේ චතුරාණි රණවාරණ වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986 වර්ෂයේ ජූනි මස 04 වැනි දින ප්‍රදාන කර ඇති අංක පොළ/ප්‍ර/10452 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක බී. ඕ. පී. 317, බොරළුකන්ද, තල්පොත ලිපිනයේ පදිංචි ලියන ආරච්චිගේ ජේම්ස් අප්පුහාමි යන අය වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1/3/1/84 යටතේ 1988.03.15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇත. එබැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2023.02.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

උතුරු මැද පළාතේ, පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුවේ 76 ඒ ගැමුණුපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තල්පොත නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ජ. පි. පො. 105 දරන පිඹුරේ අංක 55 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 03, පර්. 29 විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම. ගැමුණුපුර ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | 37, 54, |
| *නැගෙනහිරට* | : | 36, |
| *දකුණට* | : | 57, 56, |
| *බස්නාහිරට* | : | 37. |

ආර්. ඩබ්. ආර්. එම්. සී. රණවාරණ,
ප්‍රාදේශීය ලේකම්,
ලංකාපුර.

2022 ජූනි මස 27 වැනි දින,

01-263

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ඩබ්. එම්. අයි. කරුණාරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.02.28 වැනි දින ප්‍රදානය කර ඇති අංක පො/ප්‍ර/මැදි/9028 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 267, යාය 12, මහඅඹගස්වැව හි පදිංචි තන්තිරි අච්චිල්ලාගේ පොඩි මහත්මයා වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 4/11/331 යටතේ 1997.07.24 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2023.02.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුවේ 101 නාගරපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කවුඩුලුවැව II පියවර යාය 12 නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ රජයේ මිනින්දෝරු විසින් සම්පාදිත රේඛා සටහන් අංක 267 දරන බිම කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 01 ක් පමණ විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම ගොඩ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 266 ගොඩ ඉඩම, |
| *නැගෙනහිරට* | : | ප්‍රධාන පාර රක්ෂිතය, |
| *දකුණට* | : | අතුරු පාර රක්ෂිතය, |
| *බස්නාහිරට* | : | අංක 265 ගොඩ ඉඩම. |

ඩබ්. එම්. ඉන්දික කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මැදිරිගිරිය.

2022 සැප්තැම්බර් මස 26 වැනි දින,

01-262

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ඩබ්. එම්. අයි. කරුණාරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988.03.25 වැනි දින ප්‍රදානය කර ඇති අංක පො/ප්‍ර/මැදි/12529 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන නවනගරය, යාය 02, අංක 87 හි පදිංචි අබේකෝන් මුදියන්සේලාගේ හීන්බණ්ඩා වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 4/4/224(1) යටතේ 1988.09.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2023.02.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුවේ 68 සී කවුඩුලුවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කවුඩුලුවැව II පියවර නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ජ. පි. පො. 163 දරන පිඹුරෙහි රේඛා සටහනේ අංක 174 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.414 ක් පමණ විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ මඩ ඉඩම.

*උතුරට* : 178,
*නැගෙනහිරට* : 170,
*දකුණට* : 171,
*බස්නාහිරට* : 154.

ඩබ්. එම්. ඉන්දික කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මැදිරිගිරිය.

2022 ජූනි මස 10 වැනි දින,

01-261

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ඩබ්. එම්. අයි. කරුණාරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988.03.25 වැනි දින ප්‍රදානය කර ඇති අංක පො/ප්‍ර/12564 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 135/2, කවුඩුළුවැව දෙවන පියවර හි පදිංචි ගලගෙදර මුදියන්සේලාගේ ආතර් වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 4/4/168(1) යටතේ 1988.09.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2023.02.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුවේ 68 සී නවනගරය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කවුඩුලුවැව II පියවර නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ජ. පි. පො. 163 දරන පිඹුරෙහි කැබලි අංක 55 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.906 ක් පමණ විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, මැදිරිගිරිය මූකලාන යනුවෙන් හඳුන්වන රජයේ ඉඩම.

*උතුරට* : 49, 18,
*නැගෙනහිරට* : 18,
*දකුණට* : 56,
*බස්නාහිරට* : 53 2/2.

ඩබ්. එම්. ඉන්දික කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මැදිරිගිරිය.

2022 ඔක්තෝබර් මස 28 වැනි දින,

01-260

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ඩබ්. එම්. අයි. කරුණාරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988.03.25 වැනි දින ප්‍රදානය කර ඇති අංක පො/ප්‍ර/12566 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 135/2, කවුඩුළුවැව දෙවන පියවර හි පදිංචි ගලගෙදර මුදියන්සේලාගේ ආතර් වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 4/4/170(1) යටතේ 1988.09.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2023.02.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුවේ 68 සී නවනගරය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කවුඩුලුවැව II පියවර නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ජ. පි. පො. 163 දරන පිඹුරෙහි කැබලි අංක 247දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.473 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දක්වෙන පරිදි මායිම් වූ ද, මැදිරිගිරිය මූකලාන යනුවෙන් හඳුන්වන රජයේ ඉඩම.

*උතුරට* : 242,
*නැගෙනහිරට* : 245,
*දකුණට* : 217,
*බස්නාහිරට* : 217.

ඩබ්. එම්. ඉන්දික කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මැදිරිගිරිය.

2022 ඔක්තෝබර් මස 28 වැනි දින,

01-259

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ඩබ්. එම්. අයි. කරුණාරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.03.18 වැනි දින ප්‍රදානය කර ඇති අංක පො/ප්‍ර/මැදි 9135 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 53, මාතර කඩේ බාරේ, යාය 08, මහඅඹගස්වැව හි පදිංචි ආරච්චි මුදියන්සේලාගේ පුංචිබණ්ඩා වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1/4/1/1006 යටතේ 1998.04.15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2023.02.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුවේ 103 අඹගස්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කවුඩුලුවැව II පියවර, යාය 08 නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ රජයේ මිනින්දෝරු විසින් සම්පාදිත රේඛා සටහනේ අංක 53 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 02ක් පමණ විශාලත්වය ඇත්තාවූ ද, පහත දක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම (මඩ ඉඩම).

*උතුරට* : එෆ්. සී. 10 තෙක් ඇළ රක්ෂිතය,
*නැගෙනහිරට* : අංක 54 මඩ ඉඩම,
*දකුණට* : එෆ්. සී 09 කෙත් ඇළ රක්ෂිතය,
*බස්නාහිරට* : අංක 52 මඩ ඉඩම.

ඩබ්. එම්. ඉන්දික කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මැදිරිගිරිය.

2022 සැප්තැම්බර් මස 26 වැනි දින,

01-258

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ඩබ්. එම්. අයි. කරුණාරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.05.26 වැනි දින ප්‍රදානය කර ඇති අංක පො/ප්‍ර/මැදි 7646 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 20, යාය 12, මහඅඹගස්වැව හි පදිංචි විල්ලව ආරච්චිගේ ජයතිස්ස වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 4/28/125 යටතේ 1997.10.10 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2023.02.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිංහල පත්තුවේ 102 ජයගම්පුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කවුඩුලුවැව II පියවර, යාය 12 නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. භූ. පි. 11 අ. පි. අ. 263 දරන රේඛා සටහනේ අංක 2615 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.355ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම ගොඩ ඉඩම.

*උතුරට* : කැබලි අංක 2607,
*නැගෙනහිරට* : කැබලි අංක 2607,
*දකුණට* : කැබලි අංක 2616,
*බස්නාහිරට* : කැබලි අංක 2667.

ඩබ්. එම්. ඉන්දික කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මැදිරිගිරිය.

2022 සැප්තැම්බර් මස 22 වැනි දින,

01-257

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) දිසානායක මුදියන්සේලාගේ අනුර කුමාර දිසානායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්ති යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.05.21 වැනි දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 14772 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වැවගම වත්ත, වැවගම පදිංචි රම්මෙන්ත දූරයලාගේ රත්නපාල වෙත ප්‍රදානය කොට කුලියාපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කුලි/කේ/7/158 යටතේ 1986.08.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2023.02.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මයුරාවතී කෝරළේ 1096 වැවගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වැවගම නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 07 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ග. පි. 945 පිඹුරෙහි අංක 60 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.198 ක් විශාලත්වය ඇත්තාවූ ද ඉහත දක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම, වැවගම වත්ත.

*උතුරට* : කැබලි අංක 40 පාර,
*නැගෙනහිරට* : කැබලි අංක 61,
*දකුණට* : කැබලි අංක 76, 77,75,
*බස්නාහිරට* : කැබලි අංක 59.

ඩී. එම්. ඒ. කේ. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
කුලියාපිටිය (බටහිර).

2022 ජූනි මස 01 වැනි දින,

01-256

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් මල්ලව රාලලාගේ මුදිතා සුජීවනී මල්ලව වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.25 වැනි දින ප්‍රදානය කර ඇති අංක 56677 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තුඹුල්ල, නවතල්වත්ත පදිංචි රත්නායක මුදියන්සේලාගේ ගාමිනී ප්‍රේමතිලක වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 7122/1516/96 යටතේ 1996.05.07 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2023.02.13 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹදෙණි උඩුකහ දකුණු කෝරළේ, 1013 තුඹුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තුඹුල්ල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 11 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/විසින් සම්පාදිත අංක අ. ග. පි. 481 දරන රේඛා සටහනේ අංක 316 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.364 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම,

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 315, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 288 පාර, |
| *දකුණට* | : | කැබලි අංක 318, |
| *බස්නාහිරට* | : | තල්වත්ත ගම් මායිම. |

එම්. ආර්. එම්. එස්. මල්ලව,
ප්‍රාදේශීය ලේකම්,
අලව්ව.

2022 අගෝස්තු මස 26 වැනි දින,

01-255

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහවැලි සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමණාකාර ඉම්හාමි මුදියන්සේලාගේ උභය කල්‍යාණ කුමාර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (04) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2004.06.07 වැනි දින ප්‍රදානය කර ඇති අංක අම්/සී/මහ/ප්‍ර/6726 (වාරි) දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 89, කුඩාගල පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ ජයන්තා මාලනී වෙත ප්‍රදානය කොට අම්පාර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක E 41/100 යටතේ 2005.09.12 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.02.28** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බින්තැන්න පත්තුවේ/කෝරළේ කදිරපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කුඩාගල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මු. පි. අම්. 2259 දරන රේඛා සටහනේ අංක 14 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, හෙක්ටයාර් 0.911 විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 15 සහ 02 වැනි බිම් කැබලි, |
| *නැගෙනහිරට* | : | අංක 02 සහ 13 වැනි බිම් කැබලි, |
| *දකුණට* | : | අංක 13 සහ 16 වැනි බිම් කැබලි, |
| *බස්නාහිරට* | : | අංක 16 සහ 15 වැනි බිම් කැබලි. |

අයි. එම්. උභය කල්‍යාණ කුමාර,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
දෙහිඅත්තකණ්ඩිය.

2022 නොවැම්බර් මස 28 වැනි දින,

01-250

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

ඌව පළාත් සභාවේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉළුක්තැන්නේ ගෙදර ඉරෝෂ් තරංග රත්නායක වන මම ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති තුමා විසින් 1997 ක් වූ සැප්තැම්බර් මස අට වැනි දින ප්‍රධාන කර ඇති බදු/ප්‍ර 41413 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පූනාගල, මහකන්ද තේ කම්හල, මල්වැන් ඩිවිෂන් හි පදිංචි එදිරිසූරිය මුදියන්සේලාගේ සුදුබණ්ඩා වෙත ප්‍රදානය කොට බදුල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක L. D. O. 266/1998 යටතේ 1998.01.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2023.02.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහපළාත පත්තුවේ/කෝරළේ බැද්දෙඅරාව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ලියන්ගහවෙල (අ. ග. සි. 247) නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් පර්චස් 30ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත පරිදි මායිම් වූ ද බලගලවත්ත නමැති රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ආර්. එම්. අනෝහාමිගේ ඉඩම හා මාර්ග රක්ෂිතය, |
| *නැගෙනහිරට* | : | ප්‍රවේශ මාර්ග රක්ෂිතය, |
| *දකුණට* | : | ප්‍රවේශ මාර්ග රක්ෂිතය, |
| *බස්නාහිරට* | : | බී. එම්. රම්බණ්ඩාගේ ඉඩම. |

අයි. ජී. අයි. ටී. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
බණ්ඩාරවෙල.

2022 නොවැම්බර් මස 30 වැනි දින,

01-240/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

ඌව පළාත් සභාවේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්(අන්තර් පළාත්)ඉළුක්තැන්නේ ගෙදර ඉරෝෂ් තරංග රත්නායක වන මම ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති තුමා විසින් 1938 ක් වූ ජූලි මස විසිහත් වැනි දින ප්‍රධාන කර ඇති ග්‍රාන්ට් 434 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ආනන්ද ශාස්ත්‍රාලය, කෝට්ටේ, පදිංචි පුංචි බණ්ඩාර නියංගොඩ වෙත ප්‍රදානය කොට බදුල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක L. D. O. 3917/1938 යටතේ 1938.09.14 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.02.17** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහපළාත පත්තුවේ/කෝරළේ කිණිගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උඩුකිඳ (අ. ග. සි. 19) නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්. 01, රූඩ් 02, පර්. 36ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත පරිදි මායිම් වූ නත්තාරංවැල්අරාව වත්ත නමැති රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | -, |
| *නැගෙනහිරට* | : | -, |
| *දකුණට* | : | -, |
| *බස්නාහිරට* | : | -. |

අයි. ජී. අයි. ටී. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
බණ්ඩාරවෙල.

2022 ජුනි මස 30 වැනි දින,

01-240/2

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම 104 (අ) උප වගන්තිය සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, තුෂාරි පී. සූරියආරච්චි වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යතේ අතිගරු ජනාධිපති තුමා විසින් 1995.11.05 දින ප්‍රදානය කර ඇති අංක මාර/14/ප්‍ර 18298 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කනංකෙ කඩ වීදිය නිවිතිවැල්බොක්ක පදිංචි තෙලිකෝරලගේ අල්ලිස් ගුණපාල වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO D 13/136 යටතේ 1995.11.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 (අ) උප වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.03.10** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, වැලිපිටිය වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම කෝරළේ නිවිතිවැල්බොක්ක ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නිවිතිවැල්බොක්ක නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 03, පර්. 39.5 ක් විශාලත්වය අත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම: නිවිතිවැල්බොක්ක.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ටී. කේ. පියසේනගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | ඩී. ජී. මැන්ඩිස් අප්පුගේ ඉඩම, |
| *දකුණට* | : | ඊ. කේ. මැන්ඩිස් අප්පුගේ ඉඩම, |
| *බස්නාහිරට* | : | බී. ඒ. සෝමදාසගේ ඉඩම. |

තුෂාරි පී. සූරියආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
වැලිපිටිය.

2022 ඔක්තෝබර් මස 28 වැනි දින,

01-335

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, කේ. ජී. ඩී. අනෝජා වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.13 දින ප්‍රදානය කර ඇති අංක මාර/4/ප්‍ර/20501 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කනංකෙ කඩ වීදිය, තෙපුදෙනිය, අංක 56 ලිපිනයේ පදිංචි මුදුග මුව හේවගේ රත්නපාල වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 117 යටතේ 2009.02.02 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2023.031.0 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම් කෝරළේ උතුර නිමලව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නිමලව නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම - සෙමිඩේල් වත්ත.

| | | |
|---|---|---|
| *උතුරට* | : | එච්. ජී. විමලසිරිගේ ඉඩම (මා/අකු/නිම/371/295), |
| *නැගෙනහිරට* | : | එන්. වී. ආදරවතිගේ ඉඩම (මා/අකු/නිම/371/338), |
| *දකුණට* | : | බී. එච්. සුනිල්ගේ ඉඩම (මා/අකු/නිම/371/331), එම්. එච්. ඉන්ද්‍රපාල ජයවර්ධනගේ ඉඩම (මා/අකු/නිම/371/311) |
| *බස්නාහිරට* | : | ඩබ්. එම්. චන්ද්‍රානිගේ ඉඩම (මා/අකු/නිම/371/310) . |

කේ. ජී. ඩී. අනෝජා,
ප්‍රාදේශීය ලේකම්,
අකුරැස්ස.

2022 නොවැම්බර් මස 28 වැනි දින,

01-336/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, කේ. ඩී. ජී. අනෝජා වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.03.28 දින ප්‍රදානය කර ඇති අංක මාර/4/ප්‍ර/30472 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තිබ්බොටුවාව, අඩස්සූරිය වත්ත, ලිපිනයැති මුතුගමගේ චන්ද්‍රදාස වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 3453 යටතේ 1996.08.15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2023.03.10 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම් කෝරළේ උතුර පෝරඹ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පෝරඹ සහ හිග්ගොඩ නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. 540 දරන ක්ෂේත්‍ර පත්‍රයෙ හි අංක මාර/90/176 දරන රේඛා සටහනේ අංක ඒ. ඩබ්. දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් පර්. 20ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම - කොස්ගහගොඩ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | 67 සහ ඒ වී කැබලි, |
| *නැගෙනහිරට* | : | පාර සහ ඒ එක්ස් කැබැල්ල, |
| *දකුණට* | : | පාර, |
| *බස්නාහිරට* | : | ඒ වී කැබැල්ල. |

කේ. ජී. ඩී. අනෝජා,
ප්‍රාදේශීය ලේකම්,
අකුරැස්ස.

2022 නොවැම්බර් මස 22 වැනි දින,

01-336/2

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/70519.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NCP/PLC/L11/04/ නොච්/දී.කා.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 327 - හුණුවිලගම ග්‍රාම නිලධාරි වසමේ, හුණුවිලගම ගමේ අ. ග. පි. 722 හි කැබලි අංක 4න් කොටසක් පෙන්වීමට ඉඩම් නිලධාරි විසින් අඳින ලද NOC/LND/CROWN/327/16 හි දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 01 රූඩ් 01, පර්චස් 27.2 ක් පමණ වූ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ළහිරු දනිත දිසානායක ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

01. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ :

| | | |
|---|---|---|
| උතුරට | : | ප්‍රවේශ මාර්ගය හා රජයේ ඉඩම, |
| නැගෙනහිරට | : | රජයේ ඉඩම, |
| දකුණට | : | රජයේ ඉඩම, |
| බටහිරට | : | අතුරු පාර රක්ෂිතය හා රජයේ ඉඩම. |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය*.- අවුරුදු තිහයි. (30) (2022.11.30 දින සිට වසර 30ක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල*.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ

තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එයට කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

වාර මුදල. - වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන සිට දින අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙක් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඉ) සාදා ඇති /සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2022.11.30 දින සිට වසර 05ක් ගත වන තුරු පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කල දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී. කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 දෙසැම්බර් මස 13 වැනි දින,
''මිහිකත මැදුර'' ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-302

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/66825.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : HDLC/02/40/06/52.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පහජ්ජාව ග්‍රාම නිලධාරි වසමේ, නාකුළුගමුව ගමෙහි පිහිටි අ. ග. පි. 302 පිඹුරෙහි කැබලි අංක 483 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.025ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් සමිති කටයුතු සඳහා කාන්තා සංවර්ධන මහා සංගමය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 482, |
| නැගෙනහිරට | : | කැබලි අංක 156, |
| දකුණට | : | කැබලි අංක 388, |
| බටහිරට | : | කැබලි අංක 386. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු පහයි. (05) (ගරු ඇමතිතුමා බදු අනුමත කළ 2022.01.21 දින සිට)

*වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2022 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි.

වාර මුදල. - වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඉ) සාදා ඇති /සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* ගරු ඇමතිතුමා බදු අනුමත කළ 2022.01.21 දින සිට අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 ජනවාරි මස 12 වැනි දින,
අංක 1200/6 හි,
ඉඩම් මහලේකම් කාර්යාලය, ''මිහිකත මැදුර''
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-334

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.